සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වනඅධියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/11/ITD/01/ Computer & Assets

ඔබේ අංකය / உமது இல / Your No: ..................

දිනය / திகதி / Date: 2017.01.04

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ,
සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකාර අධ්‍යක්ෂකවරුන්,

**<u>දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති මට්ටමින් පරිගණක අළුත්වැඩියාවට හා ජාල පද්ධතියක් පවත්වාගෙ යාමට අවශ්‍ය උපකරන කට්ටලයක් (Toolkit)මිලදී ගැනීම</u>**

දිවැනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතුවලට තොරතුරු තාක්ෂණයේ භාවිතය ඉතා සීඝ්‍රයෙන් වැඩිවී යන මෙම කාල වකවානුව තුල පරිගණක ආශ්‍රිත තාක්ෂණික ගැටළු ඇතිවීම ඉතා සුලබ තත්වයකි. මෙම තත්තවයට මුහුණ දීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් තෝරාගත් සමෘද්ධි නිලධාරින්ට පරිගණක දෘඩාංග පිළිබඳ පුහුණුවක් (A+) ලබා දී ඇත.

පරිගණක ආශ්‍රිත තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීමේ දී පරිගණක අළුත්වැඩියා කිරීමට අවශ්‍ය උපකරණ කට්ටලයක් (Toolkit) ලබා දෙන ලෙස එම නිලධාරින් විසින් දිගින් දිගට ඉල්ලීම් කරන ලදි එමෙන්ම දැනට ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය යටතේ සෑම බැංකුවකම අභ්‍යන්තර ජාල පද්ධතිය (Local Area Network) සකස් කළ යුතුය. මෙලෙස අභ්‍යන්තර ජාල පද්ධතිය සකස් කරන ආකාරය පිළිබඳ පුහුණුවක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගත් නිලධාරින් සඳහා ලබා දෙන ලදි. මෙම ජාල පද්ධතිය සකස් කිරීමට හා දැනට භාවිතා කරනු ලබන පරිගණකවල සේවා කටයුතු සිදුකර මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වාගෙන යාමට උපකරණ කට්ටලයක් අත්‍යාවශ්‍යව ඇත. එම නිසා පරිගණක අළුත්වැඩියාවට හා ජාල පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ කට්ටලයක අඩංගු විය යුතු පහත සඳහන් උපාංග රු. 25,000/= ක උපරිමයකට යටත්ව මහසංගම් අරමුදලින් මිලදී ගැනීමට මේ මගින් අනුමැතිය ලබා දෙමි.

1. Crimping toolwith Cable Stripper – 01
2. Cable tester – 01 (RJ-45/RJ-11)
3. Punching down tool – 01
4. Electronic blower – 01

මෙම උපකරණ මිලදී ගැනීමේ දී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව හරහා මිලදීගන්නා ලෙස කාරුණිකව ඉල්ලන අතර ඉහත සඳහන් උපකරනවල විස්තර හා පිරිවිතරයන් මේ සමඟ අමුණා ඇත.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral | අධ්‍යක්ෂ )පාලන( / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

මේ සම්බන්ධයෙන් යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් තොරතුරු තාක්ෂණ අංශයේ පහත සඳහන් නිලධාරින් අමතන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්. දේවන්රාජ් - 071-4396406

සිසිර දිසානායක - 071-4446088

නීල් හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ප්‍රධාන ගණකාධිකාරි - ගිණුම් අංශය - දැ.ගැ.පි. හා අ.ක.ස.
2. අධ්‍යක්ෂ ක්ෂුද්‍රමූල්‍ය - ක්ෂුද්‍රමූල්‍ය අංශය - දැ.ගැ.පි. හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන අංශය - දැ.ගැ.පි. හා අ.ක.ස.